# කොළඹ නගරයේ නාගරීකරණය

ටී. ඩබ්. එස්. කාංචනමාලා[1] කේ. එල්. සී. එස්. චන්ද්‍රසිරි[2]

## සංක්ෂේපය

නාගරීකරණය ලෝකය පුරා විශාල ලෙස පැතිරී ඇති සමාජමය විපර්යාසයන් අතර ප්‍රධාන එකකි. එමෙන්ම නාගරීකරණය හැමතැනම ඒකාකාරව වර්ධනය වූ ක්‍රියාකාරකමක් නොවන අතර 'නගර' යන්නට ඍජු නිර්වචනයක සහාය ගැනීමද දුෂ්කරය. නගරයක්, වාණිජ, මූල්‍ය, අධ්‍යාපන, සෞඛ්‍යය, පරිපාලන ආදී විවිධ කාර්යයන් සංකේන්ද්‍රණය වූ ජනාවාසයකි. කොළඹ නගරයේ නාගරික පද්ධතිය තුළ සුවිශේෂී ස්ථානයක් හිමි කරගෙන ඇති බව ප්‍රත්‍යක්ෂ වන අතර කොළඹ නගරයේ නාගරීකරණය නිසා ජනතාවගේ සාමාජික, ආර්ථික, සදාචාරය ආදී තත්ත්වයන්ට ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වයන් මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වේ. මේ නිසා කොළඹ නගරවාසීන්ගේ ජීවන තත්ත්වයට නාගරීකරණයේ බලපෑම අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. අධ්‍යයනය සඳහා ද්විතියීක මුලාශ්‍ර මඟින් අධ්‍යයනය සඳහා දත්ත රැස් කරගන්නා ලදී. අධ්‍යයනයට අනුව කොළඹ නගරය නාගරික පද්ධතිය තුළ සුවිශේෂ ස්ථානයක් හිමි කරගෙන ඇති අතර අනෙක් නගර සූරාකමින් කොළඹ නගරය ඉදිරියට පැමිණ ඇත. කොළඹ නගරයේ ජනගහනය 1981 සිට 2001 දක්වා ජන සංඛ්‍යාව වර්ධනය වී ඇත්තේ 10.1% පමණකි. දිනෙන් දින සිදුවන වාහන තදබදයට හේතුව සංකීර්ණ වන නාගරික පසුබිම තුළ ජනගහනය වර්ධනය, සේවා නියුක්තිය වර්ධනය මහ බැංකු වාර්තා ඔස්සේද තවදුරටත් තහවුරු වේ. සමාජ තත්ත්වය ඉහළ යමින් නව සංකල්ප ජනතාව තුළට පැමිණීමත්, කොළඹ වාණිජ නගරය බවට පත් වෙමින්, වෙළඳපොළ පුළුල් වීම නිසා ජීවන තත්ත්වය ඉහළ ගොස් ඇති බවද දැකිය හැක. මුඩුක්කු හා පැල්පත්වාසී ජනතාව තුළ දක්නට ලැබෙන ප්‍රචණ්ඩකාරී ක්‍රියා, අපරාධ වැනි නීති විරෝධී ක්‍රියා ක්‍රියාත්මක වන බවද දැකිය හැක. රාජ්‍ය ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ සංඛ්‍යාලේඛනයට අනුව, පවුල් 543ක් කොළඹ අවට ප්‍රදේශවල ද, කොළඹ නගරයේ අවිධිමත් නාගරීකරණය නිසා කොළඹ නගරය ගංවතුර වලට මුහුණ දෙන බවද සඳහන් වී ඇත. මෙම අධ්‍යයනය සිදු කිරීමේදී නාගරීකරණයට, අභ්‍යන්තරව සිදුවන ග්‍රාමීය නාගරික සංක්‍රමණ, ස්වාභාවික වර්ධනය වැනි සාධක පසුබිම් වී ඇත. මෙම අධ්‍යයනයේ දී, ප්‍රජා විද්‍යාත්මක, මුඩුක්කු පැල්පත් වාසීන්ගේ අඩු ආදායම් මට්ටම, නුපුහුණු ශ්‍රමිකයන්ගේ වර්ධනය, රැකියා විරහිත තරුණයන් බිහි වී තිබීම ,මිනිස් භූමි අනුපාතය පහළ වැටීම ආදී ජනතාවගේ විවිධ ප්‍රශ්නයන් ද හඳුනා ගත හැකි විය. මෙයට විධිමත් නාගරික පද්ධතියක අවශ්‍යතාවය පැහැදිලි ලෙස දක්නට ලැබුණ අතර නගර නිර්මාණය, ආර්ථික හා සමාජීය ගැටලු නිරාකරණය විධිමත්ව හා කඩිනම් පියවර ගැනීමෙන් කොළඹ නගරයේ ජීවන තත්ත්වය වඩා සුභදායී කරගත හැකි වේ.

**මුඛ්‍ය පද :** කොළඹ නගරය, නාගරීකරණය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, savi26kanchana@gmail.com

[2] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathu28subodhi@gmail.com